**වී අලෙවි මණ්ඩලය 2012**

**----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 මතය ව්‍යාංචනය

**------------------**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

**-------------------------------------**

#### 1.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

**-------------------------------**

මණ්ඩලය නිරන්තරයෙන් මිලදීගෙන තිබූ වී තොග වෙළඳපොළ මිලට හා පිරිවැයට වඩා අඩු මිලකට විකිණීම හේතුවෙන් ඊළඟ කන්නයේ වී මිලදීගැනීම සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීම හා අලෙවියෙන් වූ පාඩු පියවා ගැනීමට වාර්ෂිකව භාණ්ඩාගාරයෙන් සහ රාජ්‍ය බැංකු වෙතින් ණය ලබා ගැනීමේ ක්‍රමවේදය පෙර වර්ෂයේ මෙන්ම මෙම වර්ෂයේදීද ක්‍රියාත්මක කර තිබුණි. මෙම තත්ත්වය හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සංචිතය සෘණ රු.බිලියන 2 ක් වී තිබීම නිසා රජයේ හෝ වෙනත් මූල්‍ය අනුග්‍රහයකින් තොරව මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම සඳහා පවත්නා අවදානමට බලපෑමක් නොවේය යන්න බැහැර කළ නොහැකි විය.

#### 1.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

**----------------------------**

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - 9**

**------------------------------**

ගිණුම් කාලපරිච්ඡේදය තුල ආයතනයේ මුදල් ගලායාම් හා ගලාඒම් පිළිබිඹු වන පරිදි ක්‍රියාකාරකම් අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළයුතු වුවත් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පහත දුර්වලතා නිරීක්ෂණය වූයෙන් එහි තුල්‍යතාවය විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(i) සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය ප්‍රමාණය රු.5,255,270 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු.5,379,590 ක් ලෙස දක්වා තිබුණි.

(ii) විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ රු.35,350,000 ක් වූ පුනරාවර්තන ප්‍රදාන වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණු අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒම් ලෙසද නැවත වරක් ඇතුළත් කර තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ දේපළ පිරියත හා උපකරණ මිලදී ගැනීම් රු.260,687,228 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ එය රු.1,795,356 ක මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබුණි.

### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

1998 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.1,647,368 ක් වූ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සළසා නොතිබුණි.

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු. 272,646,416 ක්වූ ස්ථාවර වත්කම් හා වටිනාකම රු.3,862,937,224 ක්වූ වී, සෝයා බෝංචි, සහල් සහ මාර්ගස්ථ තොග සහ මෝල්හිමියන්ගෙන් ලැබිය යුතු එකතුව රු. 36,896,844 ක් සඳහා පිළිවෙලින් ස්ථාවර වත්කම් ලේඛනය, හිමිකම් ඔප්පු, හා සමීක්ෂණ මණ්ඩල වාර්තා, තොග ලේඛන, තොග සමීක්ෂණ වාර්තා හා මාර්ගස්ථ තොග සහ ණයගැති ශේෂ සනාථ කිරීමේ ලියවිලි හා උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීම නිසා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සිදුකර තිබුණු රු.1,811,390,434 කට අදාල ගැලපීම් සම්බන්ධ කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවීය.

(ඇ) අවිනිශ්චිත ගිණුමේ රු.180,422,896 ක බැර ශේෂය කපා හැරීමට අදාල අනුමැතිය හා විස්තර 2015 ජූලි 31 දින වනවිටද විගණනයට ඉදිරිපත් නොවීය.

### 1.3 නීතිරීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

----------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතිරීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (5) (ඕ) වගන්තිය | විගණකාධිපතිවරයාගේ එකඟත්වය ඇතිව අභ්‍යන්තර විගණන වැඩසටහනක් පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 135 සිට 139 දක්වා වූ රෙගුලාසි | මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් පැවරීම හා මූල්‍ය බලතල බෙදීම සිදු කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 188 (2) | ඉකුත් වර්ෂවල සිට ඉදිරියට ගෙනවිත් තිබූ බැංකුවේ තැන්පත් කළ එහෙත් 2012 වර්ෂයේ අවසානය තෙක්ම උපලබ්ධි නොවුණු එකතුව රු.12,839,744 ක්වූ චෙක්පත් 05ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| මුදල් රෙගුලාසි 387 | නිල බැංකු ගිණුමකින් චෙක්පත් නිකුත් කිරීමට පෙර ගිණුමේ වාසිදායක ප්‍රමාණවත් මුදල් ශේෂයක් තිබිය යුතු බවට ගෙවීම් නිලධාරියා සහතික විය යුතු වුවද, මණ්ඩලයට අයත් බැංකු ගිණුම් 05 කින් මුදල් නොමැතිව චෙක්පත් නිකුත් කිරීම නිසා එකතුව රු.61,834,763 ක බැංකු අයිරාවක් 2012 දෙසැම්බර් 31 දිනට ඇති වී තිබුණි. ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතියද ලබාගෙන නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.272,646,416 ක් වූ ස්ථාවර වත්කම් හා එකතුව රු.3,862,937,224 ක් වූ තොග වර්ෂ 7 කට වැඩි කාලපරිච්ඡේදයක සිට සමීක්ෂණය කර නොතිබුණි. |
| (ඇ) 2007 ජූලි 25 දිනැති අංක 07/199/315/31 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාර ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරිය ඈවර කර ඊට අයත් සියළුම වත්කම් හා බැරකම් මණ්ඩලය වෙත පවරා ගත යුතු වූවත්, එකතුව රු.184,658,970 ක් වූ ස්ථාවර තැන්පතු, ඉතිරි කිරීමේ තැන්පතු, අතැති මුදල් ශේෂ, සේවක අත්තිකාරම් යනාදී වත්කම් පමණක් පවරාගෙන තිබුණි. අනෙකුත් වත්කම් හා වගකීම් පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2010 දෙසැම්බර් 16 දිනැති අංක අමප/10/2762/447/013 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාර, සහල් මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබූ රු.මිලියන 2,000 ක් වූ අත්තිකාරම සහල් අලෙවියෙන් ලද මුදලින් පියවීමට කටයුතු කළ යුතු වූවද, වර්ෂය තුළ සහල් අලෙවියෙන් ලද රු.708,232,048 ක මුදලින් මෙම අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් අලාභය රු.1,996,230,034 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ලාභය රු.263,796,088 වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,260,026,122 ක දැඩි පිරිහීමක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව වී තොග අලෙවි පිරිවැය රු.1,605,414,063 කින් වැඩිවීමත්, ණය හා අයිරා පොළී ඇතුළු මූල්‍ය වියදම් රු.238,009,870 කින් වැඩිවීමත් මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

### 3.1 කාර්යසාධනය

---------------

1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනතේ 3 සහ 10 වගන්ති අනුව, වී සහ සහල් කෙටීමේ,පැහීමේ හා සකස් කිරීමේ ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමත් සහ පෞද්ගලික වී මෝල් ලියාපදිංචි කිරීමේ කටයුතුත් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබුණද, ඉන් බැහැරව අවිධිමත්ව තෝරා ගත් වී මෝල්හිමියන් කිහිප දෙනෙකු වෙත රු.1,510,193,268 ක් වටිනා වී තොග සහල් කර ආපසු ලබාදීමේ පදනම මත වර්ෂය තුළ නිකුත් කර තිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අංක අමප/13/0198/540/004 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් පරිදි, වී සහ සහල් අලෙවියේ සමස්ථ ක්‍රියාවලියෙන් 2012 දෙසැම්බර් 31 දින දක්වා මණ්ඩලයට සිදුවී තිබූ අලාභය රු.මිලියන 4,121.47 ක් විය. මෙම අලාභය පියවා ගැනීම සඳහා භාණ්ඩාගාරය මගින් ප්‍රදානයක් හෝ ඊට සමාන ප්‍රමාණයකින් ඔඩපණ ණය සීමා ඉහළ දමන ලෙස ඉල්ලමින් රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් 2013 පෙබරවාරි 12 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් දැක්වීම් අනුව අනාගතයේදී අවම වශයෙන් මූල්‍යමය පාඩු නොලබන පරිදි ක්‍රියාත්මක වන බවට සහතික කෙරෙන සැලැස්මක් මණ්ඩලය විසින් ඉදිරිපත් කළ යුතු බවට දක්වා තිබූ නමුත් එවැනි සැලැස්මක් මණ්ඩලය විසින් 2015 ජූලි 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

(ආ) මණ්ඩලයට නීත්‍යානුකූල අයිතියක් නොමැති ඉඩම්වල එකතුව රු.7,392,035 ක් වැය කර ගබඩා ඉදිකර තිබුණු අතර එහි අයිතිය විධිමත්ව පවරා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන්ට අනුව කාර්යසාධන සුරක්ෂණයක් ලබාගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ වී ගබඩා 03 ක්, නිලනිවාස 03ක්, සහල් සැකසුම් මධ්‍යස්ථානයක් සහ කාර්යාල ගොඩනැගිල්ලක් අලුත්වැඩියාව සඳහා කොන්ත්‍රාත් පිරිනමා තිබූ අතර අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් ලබාගැනීමෙන් තොරව රු. 17,553,456 ක අත්තිකාරම් ගෙවා තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.3 වගන්තිය ප්‍රකාරව, කොන්ත්‍රාත් ඇස්තමේන්තුවේ දක්වා ඇති අවිනිශ්චිත ප්‍රතිපාදන මුදල ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලින් සියයට 10 ක් නොඉක්මවිය යුතු වුවත්, ඉහත කොන්ත්‍රාත් සම්බන්ධයෙන් එම සීමාව ඉක්මවා රු.8,898,550 ක් ගෙවීම් කර තිබුණි.

(ඇ) විධිමත් අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් අධීක්ෂණය කිරීම සඳහා වයස අවුරුදු 60 ඉක්මවූ විශ්‍රාමික ඉංජිනේරුවරයෙකු උපදේශකවරයෙකු ලෙස පත්කර තිබූ අතර, ඔහු විසින් ඇස්තමේන්තු පරීක්ෂා කළ බවට හෝ ඒවා නිවැරදි බවට හෝ කිසිදු සහතික කිරීමක් කර

නොතිබියදී 2011 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2013 අගෝස්තු 02 දක්වා එකතුව රු.280,500 ක් උපදේශක ගාස්තු ලෙස ගෙවා තිබුණි. කෙසේ වුවද, 2013 අගෝස්තු 26 දින සිට 30 දක්වා කාලය තුල සිදු කළ භෞතික පරීක්ෂාවේ දී ඉදිකිරීම්වල බොහෝ අඩුපාඩු ඇති බව නිරීක්ෂණය විය.

## 3.4 දෘශ්‍ය අක්‍රමිකතා

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වටිනාකම රු. මිලියන 500 ක් වූ නිකවැරටිය ප්‍රදේශයේ වී/සහල් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතියට 2012 අගෝස්තු 17 දින ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත විදේශ ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබුණි. මෙම ව්‍යාපෘතියේ සිවිල් වැඩ කටයුතු සඳහා ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 78.5 (වැට් සමඟ) කින් රු.මිලියන 5 ක අත්තිකාරම් මුදලක් 2012 පෙබරවාරි 02 දින ප්‍රසම්පාදන ක්‍රියාමාර්ගයෙන් බැහැරව හා කාර්යසාධන සුරක්ෂණයක් රහිතව රාජ්‍ය සංස්ථාවක් වෙත ගෙවා තිබුණි. මෙහි ඉදිකිරීම් 2015 ජූලි 31 වනවිටත් සිදුකර නොතිබුණි.

(ආ) බැංකුවේ ගෙවීම් විස්තර අනුව, 2010 වර්ෂයේ මිලදී ගත් වී ප්‍රමාණයේ වටිනාකම රු.මිලියන 5,411.2 ක් වුවද, තොග ලැබීම් කුවිතාන්සි අනුව රු.මිලියන 5,361.6 ක වටිනා තොග පමණක් ගබඩා වෙත ලැබී තිබුණි. මේ අනුව රු.මිලියන 49.6 ක වී තොග ඌනතාවයක් අනාවරණය වීමෙන් පසු එම ගෙවීම් හා තොග ශේෂ පරීක්ෂා කර තොග ශේෂ නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස මණ්ඩලයේ සභාපතිවරයා විසින් 2013 ජනවාරි 28 දිනැති අංක පීඑම්බී/එෆ්1/01/2013 දරන ලිපිය මගින් කලාප කළමනාකරුවන් 05 දෙනෙකු වෙත නියෝග කර තිබුණි. එමෙන්ම, එම මිලදී ගැනීම් හා ගෙවීම් කටයුතු සියල්ල කලාපවල කාර්ය මණ්ඩලයෙන් සිදුව ඇති බැවින් තොග ඌනතාවයේ පාඩුව අදාල අයගෙන් අයකර ගැනීමට කටයුතු කරන බවත්, එසේ නොවේ නම් අදාල කලාප කළමනාකරුවන්ගෙන් අයකර ගැනීමට සිදුවන බවත් දන්වා තිබුණද, 2015 ජුලි 31 දින වන විටත් එම ශේෂ නිරවුල් කර ගැනීමට හෝ අදාල කලාප කළමනාකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.5 අනාර්ථික ගනුදෙනු

----------------------

ප්‍රවෘත්ති පත්‍ර සමාගමක රු.127,000 ක කොටස් ආයෝජන වෙනුවෙන් 2011 වර්ෂයේ සිට මණ්ඩලයට ප්‍රතිලාභ ලැබී නොතිබුණි.

## 3.6 අරමුදල් ඌන උපයෝජනය

---------------------------

2008 වර්ෂයේ ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරිය වී අලෙවියෙන් ලද මුදල් තැන්පත් කිරීම සඳහා ආරම්භ කර තිබුණු ඉතිරි කිරීමේ ගිණුම 2010 අප්‍රේල් 26 දින මණ්ඩලය වෙත පවරා දී තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට එම ගිණුමේ ශේෂය රු.3,853,550 ක් විය. මෙම මුදල් ඵලදායී ආයෝජනයක යෙදවීම කෙරෙහි කළමනාකරණය අවධානය යොමුකර නොතිබුණි.

## 3.7 හඳුනාගත් පාඩු

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බැංකු අයිරා හා ණය ශේෂයන් නොපියවීම හේතු කොටගෙන සමාලෝචිත වර්ෂය තුල අයිරා පොලී ලෙස රු.25,091,760 ක්ද, බැංකු ණය පොලී ලෙස රු.520,181,969 ක්ද ගෙවා තිබුණි.

(ආ) 2012 ජූලි 12 දිනැති අංක අමප/12/0815/504/041-I දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, තෝරා ගත් කලාප 05 ක 2013 ඔක්තෝබර් 31 දිනට සිදුකළ වී තොග සත්‍යාපනයේදී වී කිලෝ ග්‍රෑම් 16,853,527 ක ඌනතාවයක් වූ අතර එහි මුළු වටිනාකම රු.මිලියන 506.09 ක් විය.

(ඇ) භෞතික සත්‍යාපනයට ලක්වූ කලාප 05 හි වී තොග නියමිත කාලය තුළ නිකුත් නොකිරීම නිසා යල් පැන යාමත්, නිසි ලෙස බිම් රාක්කවල වී අසුරා නොතිබීම (ප්‍රමාණවත් බිම් රාක්ක නොතිබීම) හේතුවෙන් ගබඩා තුළට උල්දිය දැමීමත්, වහලින් වැසි ජලය ගබඩා තුළට කාන්දු වීමත්, බොහෝ ගබඩා වර්ෂා ජලයට යට වීමත් නිසා රු.මිලියන 17.44 ක් වටිනා වී කිලෝ ග්‍රෑම් 586,107 ක් විනාශ වී තිබුණි.

(ඇ) සහල් මෙට්‍රික් ටොන් 01ක් ඇමරිකානු ඩොලර් 247 බැගින් සහල් මෙට්‍රික් ටොන් 100,000 ක් එක්සත් අරාබි එමීර් රාජ්‍යයට අපනයනය කිරීමට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් විසින් ලබාදුන් තීරණයකට අනුව සමාලෝචිත වර්ෂය තුළදී සහල් මෙට්‍රික් ටොන් 22,950 ක් එක්සත් අරාබි එමීර් රාජ්‍යය වෙත අපනයනය කිරීමෙන් මණ්ඩලයට රු.මිලියන 711.50 ක ශුද්ධ අලාභයක් සිදුවී තිබුණි. තවද අපනයන කටයුතු සඳහා සහල් සකස් කිරීමේදී එහි අතුරුඵලයක් ලෙස සකස් වන කැඩුණු සහල් තොග කිලෝ ග්‍රෑම් 01 ක් රු. 35 බැගින් මිලදී ගැනීමට රාජ්‍ය ආයතනයක් ඉල්ලුම් කර තිබියදී එය නොසලකා විධිමත් අනුමැතියකින් තොරව කිලෝ ග්‍රෑම් 01ක් රු. 17.86 ක මිලකට අපනයනය කිරීමෙන් රු.මිලියන 23.29 ක අලාභයක් සිදු වී තිබුණි.

කෙසේ වුවද, 2013 මැයි 02 දිනැති “වී අලෙවි මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනට ලාභ අලාභ ගිණුම අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම හා පිරිවැය කළමනාකරණය කිරීමේ යෝජනා" යන මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ අනුව, සහල් අපනයනය හේතුවෙන් සිදුවූ ඇති අලාභයට හේතු විධිමත් පරීක්ෂණයක් මඟින් හෙළි කර ගැනීමෙන් අනතුරුව මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව, ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම කළ යුතු බවට නිරීක්ෂණය කර තිබුණද, 2014 ජූලි 31 වන විටත් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) වී තොග විකුණන තත්ත්වයට පත්වන තුරු සම්බා හා නාඩු වී කිලෝ ග්‍රෑම් 01 ක් වෙනුවෙන් පිරිවැය පිළිවෙලින් රු.35.90 ක් හා රු.33.90 ක් දරා තිබුණද, විධිමත් අනුමැතියකින් තොරව, 2011 වර්ෂයේ සිට මණ්ඩලය විසින් රාජ්‍ය ආයතනයකට එම වී කිලෝ ග්‍රෑම් 01 ක් පිළිවෙලින් රු.31.50 හා රු.25.50 බැගින් අලෙවි කිරීමෙන් මණ්ඩලය රු.මිලියන 334.04 ක අලාභයක් ලබා තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව, මුදල් වර්ෂයක් සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වූවද, 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2013 ඔක්තෝබර් 25 දින එනම් දින 239 ක කාල පමාවකින් පසුවය. එම මූල්‍ය ප්‍රකාශනද නිවැරදි නොවීම හේතුවෙන් 2014 අගෝස්තු 18 දින ආපසු මණ්ඩලය වෙත භාරදෙන ලද අතර නැවත නිවැරදි කරන ලද මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 13 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

-------------------------

2012 දෙසැම්බර් 05 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝග ප්‍රකාර අභ්‍යන්තර විගණකවරයෙකු පත් කරන තුරු රේඛීය අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන අංශය මගින් මණ්ඩලය විගණනය කළ යුතු වූවද ඒ අනුව ක්‍රියාකර විගණන වාර්තා කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 4.3 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 ඡේදය ප්‍රකාර ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් දැක්වෙන ලෙස අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර මණ්ඩලයේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය.
(ආ) ස්ථාවර වත්කම් පාලනය.
(ඇ) අභ්‍යන්තර විගණනය.
(ඈ) අයවැය පාලනය.
(ඉ) තොග පාලනය.
(ඊ) ආදායම් පාලනය.